

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

තෙවන කාණ්ඩය, 1 සහ2 කලාප 2003


## ඔබේ තේ ඉඩමටත් පොහොර යෙදුවාට දළු නැද්ද ?

"පොහොර දානව නං තමයි මහත්තයෝ ඒත් දළු ඇදෙන්නේ නැනේ."
"වැඩිම වුනොත් දළු රවුම් 2 යි නැත්තන් 3 යි පොහොර අල්ලන්නේ".
"දැන් අපට හම්බවෙන පොහොර බාලයි. වැලි කලවම් කරනව".

තේ කර්මාන්තයේ නියැලී සිටින කුඩා තේ වතු හිමියන්ගෙන් මෙවැනි මැසිවිලි නිරන්තරයෙන් අසන්නට ලැබේ. මොවුන්ගේ ඉඩම් පරීක්ෂා කර කරුණු විමසීමේදී අපට පෙනී යන්නේ දළු අඩු වීමට හේතුව පොහොර වල වරදක් නිසා නොව උපරිම කාර්යක්ෂමතාවයක් ලබා ගැනීම සඳහා පොහොර භාවිතය පිළිබඳ විධිමත් දැනුමක් ඔවුනට නොමැති වීමයි.

තේ ශාකය සැලකූ විට යොදන පොහොරෙන් විශේෂයෙන්ම නයිට්‍රජන් ශාකයට ලබා ගත හැක්කේ 35% පමණ වන අතර ඉතිරිය පහත සඳහන් පරිදි නොයෙකුත් ක්‍රම මගින් පසෙන් ඉවත් වී යයි.



1. සෝදා පාළුවට ලක්වීම
2. වාෂ්ප වීම
3. ක්ෂරණය හෙවත් පොලව යටට කිඳා බැසීම
4. වල් පැලෑටි වැනි අනෙකුත් ශාක මගින් උරා ගැනීම සහ ශාක වලට ලබා ගත නොහැකි පරිදි තිර කිරීම (පොස්පරස්)

එම නිසා යොදන පොහොරෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට නම් ඉහත ආකාර වලින් පෝෂක ඉවත් වීම අවම කල යුතුය. ඔබගේ ඉඩමෙන් පාංශු පෝෂක ඉවත් වී යාමට කරුණු රාශියක් බලපා හැකි අතර එම දෝෂ හඳුනා ගෙන පහත පරිදි පිළියම් යෙදීමෙන් යොදන පොහොරෙන් වැඩි ඵලදායීතාවයක් ලබා ගත හැක.

- පොහොර අවශෝෂණය වැඩි කිරීම සඳහා හොඳින් පැතිරුන මුල පද්ධතියක් අවශ්‍ය වේ. මේ සඳහා හොඳින් වැඩුනු දිරිමත් නිරෝගී පැල පමණක් ක්ෂේත්‍රයේ සිටුවන්න.
- ලපටි තේ වගාවකදී, පොහොර යොදා මුල්ලු කිරීම තුලින් වාෂ්පීකරණය මගින් පොහොර ඉවත් වීම අවම කල යුතුය.
- මේරූ තේ වගාවක තේ පඳුරු හොඳින් එකිනෙක යාවී ඇත් නම් පමණක් පේළි අතර පොහොර යෙදීම සිදු කල යුතු අතර පාළු බහුලව ඇත්නම් පොහොර යෙදීමේදී පඳුරු වටේට තනි තනිව යෙදීම සිදු කල යුතුය.
- එක් එක් අවධියට නිර්දේශිත පොහොර මිශ්‍රණ නිර්දේශිත ප්‍රමාණයන්ගෙන් නියමාකාරයට යොදන්න
- පසේ තෙතමනය අවශ්‍ය පමණ ඇති විට පමණක් පොහොර යෙදිය යුතු අතර සවස් කාලයේදී යෙදීමෙන් වාෂ්පීකරණය මගින් සිදුවන හානිය අවම කර ගත හැක.
- නියං කාලයේදී හා තද වැසි සහිත දිනයන්හි පොහොර යෙදීමෙන් වලකින්න.
- කිසි විටෙකත් වැසි අපේක්ෂාවෙන් පත්‍ර මතට මූලික පොහොර යෙදීම සිදු නොකරන්න.
- වසරකට අවශ්‍ය පොහොර ප්‍රමාණය අස්වනු විභවය අනුව ගණනය කර සහ වසරේ අස්වනු රටාව අධ්‍යයනය කර අධි අස්වනු කාලයේදී වැඩි පොහොර ප්‍රමානයකුත් අනෙකුත් කාලයන්හිදී අඩු පොහොර ප්‍රමාණයකුත් යෙදීම සුදුසුය.
- වසරකට නියමිත පොහොර ප්‍රමානය වැඩි වාර ගනනකින් (පසේ තෙතමනය අනුව) යෙදීමට කටයුතු කරන්න
- ගල් වැටි හා කානු සෑම පිළිසකර කිරීම, කානුගොඩ දැමීම වසරකට වරක්ම සිදු කරන්න.





- සෑම කප්පාදුවකදීම භූමිය ආවරනය වන පරිදි පාළු සිටු වීමට කටයුතු කරන්න.
- පසට හැකි පමණ කාබනික ද්‍රව්‍ය (කප්පාදු අතු, සෙවන ශාක අතු, කොල පොහොර, කොම්පෝස්ට් වැනි ) එකතු කර යොදන රසායනික පොහොර පසෙහි රඳවා ගැනීමේ හැකියාව දියුණු කරන්න.
- කප්පාදු චක්‍රයට සැරයක්වත් පසේ පී එච් අගය පරීක්ෂා කර ඩොලමයිට් යොදා පී එච් අගය 4.5 - 5.5 අතර පවත්වා ගන්න.
- උඩරට හා මැදරට කප්පාදු චක්‍රයකට වරක් හා පහතරට කප්පාදු චක්‍ර 2 කට වරක් තේ පේළි අතර පස මුල්ලු කරන්න.
- කප්පාදු කිරීමට මාස 3 කට කලින් පොහොර යෙදීම නතර කර නැවත පොහොර යෙදීම මට්ටම් කපා නව දළු පැමිනීමත් සමඟ සිදු කරන්න.
- යොදන පොහොර කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීමට අඟල් 8 - 9 ක පමණ නඩත්තු පත්‍ර තලයක් ඇති කර දළු නෙලීමේදී අරිම්බු ඉතිරි කර දළු නෙලන්න.
- පොහොර යෙදීමට පෙර වල් පැලෑටි පාලනය කරන්න.
- පොහොර යොදා දින 10 -14 ක් ඇතුලත සින්ක් සල්ෆේට් නිර්දේශිත පරිදි පත්‍ර මත ඉසින්න.




- හැකි සෑම අවස්ථාවකම පොහොර යොදා, සෙවන ශාක කප්පාදු කර ක්ෂේත්‍රයේ සෑම ස්ථානයක් ම ආවරනය වන ලෙස යෙදීමෙන් වාෂ්පීකරණය මගින් පොහොර ඉවත් වීම අවම කර ගත හැක.


කපිල කටුලන්ද